# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි. උත්පත්ති 17 : 3–9

**ආබ්‍රහම් ජාතීන් රාශියකගේ පියා බවට පත් වේ.**

එවිට ආබ්‍රහම් පසඟ පිහිටුවා වැඳ වැටිණි. දෙවියන් වහන්සේ ද ඔහු සමඟ කතා කරමින් මෙසේ වදාළ සේක. “මා නුඹ සමඟ පිහිටුවන මාගේ ගිවිසුම නම් මේ ය. නුඹ බොහෝ ජාතීන්ගේ පියා වන්නෙහි ය. මින්පසු නුඹේ නාමය ‘උතුම් පියා’ යන අර්ථය ඇති ‘ආබ්‍රම්’ නොව ජාතීන්ගේ පියාණෝ යන අර්ථය ඇති ‘ආබ්‍රහම්’ යයි කියනු ලබන්නේය. මන්ද, මා නුඹ බොහෝ ජාතීන්ගේ පියා කළ බැවිනි. මම නුඹට බොහෝ දරු සම්පත් දෙමි. නුඹෙන් ජාතීන් උපදවන්නෙමි. නුඹෙන් රජවරු පහළ වන්නාහ.

නුඹ සමඟ ද නුඹෙන් පසු පරපුරෙන් පරපුරට නුඹෙන් පැවතෙන නුඹේ පෙළපත සමඟ ද මාගේ ගිවිසුම පිහිටුවෙමි. මම නුඹේ ද, නුඹෙන් පසු පැවතෙන නුඹේ පෙළපත්වල ද දෙවියන් වහන්සේ වන බවට මාගේ සදාතන ගිවිසුම පිහිටුවමි. නුඹ දැන් විදේශීව වසන මේ දේශය මේ මුළු කානාන් දේශය නුඹට ද, නුඹෙන් පසු පැවතෙන නුඹේ පෙළපතට ද මම සදහට ම අයිති කොට දෙමි. මම ද ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි. “දෙවියන් වහන්සේ තවදුරටත් කතා කරමින් මෙසේ වදාළ සේක. “නුඹ ද නුඹෙන් පසු පරපුරෙන් පරපුරට පැවතෙන නුඹේ පෙළපත ද මාගේ ගිවිසුම ආරක්ෂා කළ යුතු ය.”

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 105 : 4 – 9

පිළිතුර: සමිඳුන්ගේ ගිවිසුම සදහට ම සිහි කරන්න.

ගීය:

සමිඳාණන් ද එතුමන්ගේ බලය ද සොයා බලන්න. එතුමාණන් හමුව නිතරම සොයන්න. එතුමන්ගේ මෙහෙකරුන් වූ ඉශ්රායෙල් වංශයෙනි, එතුමන් තෝරාගත් ජාකොබ්ගේ දරුවෙනි, එතුමන් කළ පුදුම ක්‍රියා ද එතුමන්ගේ ආශ්චර්යයන් ද එතුමන් දුන් විනිශ්චයයන් ද සිහි කරන්න.

එතුමාණෝ අපේ දෙවි සමිඳාණෝ ය. එතුමන්ගේ විනිසය මුළු පොළොවෙහි ය. එතුමන්ගේ ගිවිසුම සදහට ම සිහි කරන්න.

පරම්පරා දහසක් දක්වා එතුමන්ගේ අණ පණත් සිහි කරන්න. ඒ ගිවිසුම එතුමාණෝ ආබ්‍රහම් සමඟ කළ සේක. ඊසාක්ට ද දිවුරුම් දුන් සේක.

## සාධුකාරය

“ප්‍රසාද ජනක කාලයේ දී මම ඔබට සවන් දිනිමි. ගැලවීමේ දවසේ දී මම ඔබට පිහිට වුණෙමි.”

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 8 : 51–59

***ආබ්‍රහම් මාගේ දවස දැකීමට පුල පුලා බලා සිටියේ ය.***

“ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. යමෙක් මාගේ ධර්මය පිළිපදින්නේ නම් ඔහු කිසි කලෙක මරණය නොදකින්නේ ය”යි ජේසුස් වහන්සේ වදාළ සේක. ජුදෙව්වරු කතා කරමින් “ඔබට යක්ෂයෙකු ආවේශ වී ඇති බව දැන් අපි දනිමු. ආබ්‍රහම් මිය ගියේය. දිවැසිවරයෝ ද මිය ගියහ. එහෙත් ඔබ ‘යමෙක් මාගේ ධර්මය පිළිගන්නේ නම් ඔහු කිසි කලෙක නොමැරෙන්නේ ය’යි කියන්නෙහිය. මිය ගියාවූ අපේ පිය වූ ආබ්‍රහම්ට වඩා ඔබ උතුම් ද? දිවැසිවරයෝ පවා මිය ගියහ. ඔබ කවරෙකු කියා සිතන්නෙහි දැ”යි ඇසූහ.

ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් “මම මට ම ගෞරව කරන්නේ නම් මාගේ ගෞරවයෙහි වැදගැම්මක් නැත. මට ගෞරව කරන්නේ මාගේ පියාණන් වහන්සේ ය. ඔබේ දෙවියන් වහන්සේ යයි ඔබ කියන්නේ උන් වහන්සේ ගැන ම ය. ඔබ උන් වහන්සේ නොහඳුනන්නහු ය. එහෙත් මම උන් වහන්සේ හඳුනමි. මම උන් වහන්සේ නොහඳුනමි යි කීවොත් මමත් ඔබ හා සමාන බොරුකාරයෙක් වන්නෙමි. එහෙත් මම උන් වහන්සේ හඳුනමි. උන් වහන්සේගේ වචනය ද පිළිපදිමි. ඔබේ පිය වූ ආබ්‍රහම් මාගේ පැමිණීමේ දවස දැකීමට පුල පුලා සිටියේය. ඔහු එය දැක ප්‍රීති වී ය”යි වදාළ සේක. ජුදෙව්වරු පිළිතුරු දෙමින් “තවම වයස අවුරුදු පණහක් වත් නැති ඔබ ආබ්‍රහම් දුටුවේ කෙසේ දැ”යි ඇසූහ.

“ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. ආබ්‍රහම් උපදින්නටත් පෙර මම වීමි”යි උන් වහන්සේ වදාළ සේක. ඔව්හු උන් වහන්සේට ගසන පිණිස ගල් අතට ගත්හ. එහෙත් ජේසුස් වහන්සේ රහසිගතව දේව මාළිගාවෙන් පිටවී ගිය සේක.

**සුවිශේෂ වාක්‍යය එසේ ය.**